(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 139.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 මාර්තු 19 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1455/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් දිස්ත්‍රික්කයේ, ග්‍රාම නිලධාරි වසම් 153 අතරින්, ග්‍රාම නිලධාරින්, සංවර්ධන නිලධාරින් සහ සමෘධි සංවර්ධන නිලධාරින් සඳහා භාවිතා කිරීම සඳහා බහුකාර්ය කාර්යාල (සේවා පියස) නොමැති ග්‍රාම නිලධාරි වසම් තිබේද;

(ii) එසේ නම්, තාවකාලිකව විකල්ප ස්ථානවල ක්‍රියාත්මක වන කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රතිසංස්කරණය කළ යුතු කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iv) වැසිකිළි, ජල සහ විදුලි පහසුකම් නොමැති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(v) විදුලිය විසන්ධි කර ඇති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම අඩුපාඩු මහජනතාවට ගුණාත්මක සේවාවක් සැපයීමට බාධාවක් බව දන්නේද;

(ii) එවැනි අපහසුතා නිරාකරණය කර ගුණාත්මක හා කඩිනම් සේවාවක් සැපයීම සඳහා අදාළ අඩුපාඩු සපුරාලීමට ඇති සැලැස්ම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1502/2025

ගරු බී. ආරියවංශ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාව සිදු කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) එම දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාවේ නිරත වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) කෙසෙල් සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමට නොහැකිවීමෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාකරුවන් පීඩා විඳින බව දන්නේද;

(iv) රත්නපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාකරුවන් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1544/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටියන්තොට, වී ඔය ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ජලාශ ව්‍යාපෘතිය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය කවර ආයතනයක්/සමාගමක් මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව හෝ නොකරන බව ජනතාවට නිශ්චිතව දැනුම් නොදීමට හේතු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාවට සිදුවන හානිය හා පීඩාව සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) ව්‍යාපෘතිය හේතුවෙන් ඍජු හා වක්‍ර බලපෑම්වලට ලක්වන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නායයාමේ අධි සංවේදී කලාපයක් ලෙස නම් කර ඇති කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි මෙම ප්‍රදේශයේ පිහිටි කඳු දෙකක් හරස් කර ඉහත ජලාශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අනාගතයේදී සිදු වන බලපෑම් කවරේද;

(v) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව හෝ නොකරන බව නිශ්චිතව දැනුම් දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1551/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල මුස්ලිම් ආගමික විද්වතුන් බිහිකරන අරාබි විද්‍යාල ක්‍රියාත්මක වන බවත්;

(ii) එම විද්‍යාල වර්ගීකරණය මත පදනම්ව කාණ්ඩ 3කට ශ්‍රේණි ගත කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අරාබි විද්‍යාල වැඩි සංඛ්‍යාවක් පළමු ශ්‍රේණියට අයත් වන බැවින්, ඒවා දෙවැනි සහ තෙවැනි ශ්‍රේණි දක්වා උත්ශ්‍රේණි ගත කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එම අරාබි විද්‍යාල උත්ශ්‍රේණි ගත කිරීම සඳහා පවතින බාධා සහ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1558/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන කවරේද;

(iii) එම එක් එක් පළාත් පාලන ආයතනයට අයත් ඡන්දදායකයින්, කොට්ඨාස සහ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පළාත් පාලන ආයතන සහ පළාත් පාලන කොට්ඨාස බෙදා වෙන් කර ඇති පදනම සහ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තීරණය කර තිබෙන පදනම කවරේද;

(v) එමඟින්, සමහර සභාවන්ට මෙන්ම ඡන්දදායකයින්ටද අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා විසඳුමක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මොරවැව, ගෝමරන්කඩවල, පදවි ශ්‍රීපුර, සේරුවිල සහ වෙරුගල් යන ප්‍රාදේශීය සභා පහට අයත් මුළු ඡන්දදායකයින් සංඛ්‍යාවට වඩා මූතූර් ප්‍රාදේශීය සභාවේ මුළු ඡන්ද දායකයින් සංඛ්‍යාව වැඩි බව දන්නේද;

(ii) ජනගහනය, ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව සහ භූමි ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් මූතූර් ප්‍රාදේශීය සභාව පළාත් පාලන ආයතන දෙකකට වෙන් කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1716/2025

ගරු ආර්.ජී. විජේරත්න මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 හා 2013 වර්ෂයන්හි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයේ සේවය කළ නිලධාරියෙකුගේ වැඩ තහනම් කළ බව දන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරියාගේ නම කවරේද;

(iii) එම නිලධාරියාට යුක්තිය හා සාධාරණත්වය ඉටු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආර්ථිකය පිළිබඳ අධි සංවේදී දත්ත විකෘති කිරීම වළක්වා ගැනීම සඳහා වන වත්මන් රජයේ වැඩපිළිවෙළ කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1721/2025

ගරු ඕෂානි උමංගා මහත්මිය,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ කම්කරු නීති සංශෝධනය කරමින් පවතින්නේද;

(ii) එසේ නම්, සංශෝධනය කරනු ලබන අංශ කවරේද;

(iii) එම සංශෝධන සඳහා මැදිහත් වන බාහිර පාර්ශ්වයන් කවරේද;

(iv) එම සංශෝධන සිදු කිරීම අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන කාල රාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1783/2025

ගරු තිළිණ සමරකෝන් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම සහ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, 621-ඉහලගම, 510-කඩියංගල්ල සහ 502-මානෑව ග්‍රාම නිලධාරි වසම් තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ නිවාස ව්‍යාපෘති තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම නිවාස ව්‍යාපෘතිවල නම් සහ ක්‍රියාත්මක කළ දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිවාස ව්‍යාපෘති 03හි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ප්‍රතිලාභීන්ට ප්‍රතිපාදන ලබා දෙන ලද්දේ ආධාරයක් ලෙසද, ණය මුදලක් ලෙසද;

(v) එම ප්‍රතිලාභීන් සඳහා ලබා දුන් මුදල, නිවාස තනා නිම කර ඇති සංඛ්‍යාව සහ මේ වනවිට එම නිවාසවල පදිංචිවී සිටින සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ප්‍රතිලාභීන් තෝරාගත් ආදායම් පදනම කවරේද;

(vii) එම ප්‍රතිලාභීන් තෝරාගත් අවස්ථාවේදී ඔවුන්ගේ ආදායම් තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1822/2026

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලද වර්ෂය කවරේද;

(ii) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමට පෙර, මෝටර් රථයක් ලියාපදිංචි කිරීමේ වගකීම භාරව සිටි ආයතනය කවරේද;

(iii) ශ්‍රී ලංකාව තුළ පළමුවැනිවරට මෝටර් රථයක් ලියාපදිංචි කරන ලද වර්ෂය කවරේද;

(iv) එම වර්ෂයේ සිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන තෙක් ලියාපදිංචි කළ වාහන සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2025 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර ඇති මෝටර් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෝටර් රථ සඳහා වායු විමෝචන දුම් සහතික නිකුත් කිරීම තුළින් රජය වාර්ෂිකව ආදායමක් උපයන්නේද;

(iii) එසේ නම්, 2025 වර්ෂයේදී උපයන ලද ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1860/2026

ගරු රුවන් විජේවීර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, ජාතික පාසල් සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල ස්ථාපිත කර ඇති ශ්‍රවණාගාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බුත්තල දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලයේ ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් ආරම්භ කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) එම ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයක් තිබේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී
### **යෝජනා පිළිබඳ දැනුම්දීම**

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ අදාළ නියාමන අධිකාරීන් විමසා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 දෙසැම්බර් 29 දිනැති අංක 2469/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.03 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2026 පෙබරවාරි 20 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් මතු දැක්වෙන තත් කාරක සභා නිර්දේශ පිළිගත යුතු ය:—

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීම:—**

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීම:—**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

*3.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා,— ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2018),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2025.02.14 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.09.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.09.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*5.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*8.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

9.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1851/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 1989.11.13 වන දින ඝාතනය කරන ලද ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර මහතාගේ මරණයෙන් පසු, ඔහුගේ බිරිඳ සහ දරුවන්ට ආරක්ෂා කිරීම සඳහා රජයේ රැකවරණය ලබාදීමට රජය විසින් කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එලෙස රජයේ රැකවරණය ලබා දුන් තැනැත්තන්, රෝහණ විජේවීර මහතා සමඟ තිබූ ඥාති සම්බන්ධතාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම තැනැත්තන් රඳවාගෙන සිටි ස්ථාන කවරේද;

(iv) වර්තමානයේ රජයේ රැකවරණය සහ නඩත්තු ලබන රෝහණ විජේවීර මහතාගේ පවුලේ සාමාජිකයන් කවුරුන්ද;

(v) රෝහණ විජේවීර මහතාගේ පවුලේ සාමාජිකයන්ගේ නඩත්තුව සඳහා මෙතෙක් රජය විසින් දරා ඇති ඇස්තමේන්තුගත මුළු වියදම කොපමණද;

(vi) වර්තමානයේ රජයේ රැකවරණය ලබන එම පවුලේ සාමාජිකයන්ගේ ආරක්ෂාව සහ නඩත්තුව සඳහා මසකට රජය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?